


# අලුත් මකුළු විශේෂයක් හඳුනාගනී

ගොබ්ලින් ශ්‍රී ලංකාවට ආවේණික මකුළු විශේෂයක් බව නවතම පර්යේෂණයකින් හන්තාන ජාතික මූලික අධ්‍යයන ආයතනයේ මහාචාර්ය සුරේශ් බෙන්ජමින් මහතා විසින් සොයා ගනු ලැබීය.

ඒ ආකාරයෙන් හොබ්ලින් මකුළුවන් ගැන නවතම තොරතුරු සොයා ගෙන ඇත්තේ බෙන්ජමින් මහතා පර්යේෂණ සහකාර සසංකා රණසිංහ මහත්මිය සමග සිදු කළ පර්යේණයක ප්‍රතිඵලයක් වශයෙන් බව මහාචාර්යවරයා පැවසීය.

ඒ සම්බන්ධයෙන් බෙන්ජමින් මහතා ලංකාදීප සමග වැඩිදුරටත් මෙසේ ද පැවසීය.

ගොබ්ලින් වර්ගයට අයත් ගණ 6ක නව මකුළු විශේෂ 9 ක් හඳුනාගෙන ඇති අතර, ඒ අතුරින් ගණ 3ක්ම ශ්‍රී ලංකාවෙන් හමු වී ඇත්තේ ප්‍රථම වතාවටයි. එය විශේෂත්වයක්. මෙම සොයා ගැනීමත් සමග මෙරටින් හමු වූ ගොබ්ලින් මකුළුවන් විශේෂ 45ක් දක්වා ඉහළ ගොස් තිබෙනවා. ඉතා කුඩා පරාසයක පමණක් වාසය කරන මෙම මකුළුවන් නිසා ශ්‍රී ලංකාවේ ඉහළ ජෛව විවිධත්වයක් පවතින බවට හොඳම සාක්ෂිය සපයනවා. මේ අනුවර මෙරට ජෛව විවිධත්වය ආරක්ෂා කර ගැනීමට සඳහා පරිසර සංරක්ෂණයේ ඇති වැදගත්කම ද මනාව පැහැදිලි වෙනවා.

මේ ආකාරයෙන් හඳුනාගෙන ඇති ගොබ්ලින් මකුළුවන් විශේෂ 6 ක් සඳහා, ලෝක පූජිත ගත් කතුවරියක වන ඉනිඩ් බ්ලයිටන්ගේ නව කතාවල සිටින චරිතවල නම් භාවිත කිරීමටත් පර්යේෂකයන් කටයුතු කර තිබෙනවා. එයත් විශේෂත්වයකි.

(සෙංකඩගල සිසිර කුමාර බණ්ඩාර)